# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2231/25 - 2021 ජුනි මස 11 වැනි සිකුරාදා - 2021.06.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක : 81

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව බඩ ඉරිඟු රැස් කරන්නෙකු, ගබඩාකරුවෙකු, බෙදාහරින්නෙකු හෝ බඩ ඉරිඟු තොග වෙළෙන්දෙකු විසින් තම සන්තකයෙහි, භාරයෙහි හෝ තම පාලනය යටතෙහි ඇති බඩ ඉරිඟු ගුදම්, සයිලෝ, ගබඩා, බහාලුම් හෝ වෙනත් ස්ථාන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ලියාපදිංචි කළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ලියාපදිංචියකින් තොරව කිසිදු බඩ ඉරිඟු රැස් කරන්නෙකු, ගබඩාකරුවෙකු, බෙදාහරින්නෙකු, තොග වෙළෙන්දෙකු බඩ ඉරිඟු තම සන්තකයෙහි තබා නොගත යුතු අතර එම ගුදම්, සයිලෝ, ගබඩා, බහාලුම් හෝ වෙනත් ස්ථානවල තොග වශයෙන් හෝ අන්‍යාකාරයකින් රැස්කර ඇති බඩ ඉරිඟු ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටින විට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත සැපයිය යුතු බවට ද මෙයින් තවදුරටත් විධාන කරනු ලැබේ.

මේ වන විට බඩ ඉරිඟු තොග සන්තකයෙහි පවතින බඩ ඉරිඟු රැස්කරන්නෙකු, ගබඩාකරුවෙකු, බෙදාහරින්නෙකු, තොග වෙළෙන්දෙකු මෙම විධානය නිකුත් කළ දින සිට දින 07ක් ඇතුළත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි ලියපදිංචි විය යුතු අතර ඔවුන් භාරයෙහි ඇති බඩ ඉරිඟු තොග පිළිබඳ තොරතුරු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලබා දිය යුතු බවටද මෙයින් විධාන කරනු ලැබේ.

1A - PG 5414 — 385 (2021/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බඩ ඉරිඟු වගාකරුවකු තම වගා කළ බිමෙන් ලබා ගත් බඩ ඉරිඟු අස්වැන්න ගබඩාකර තබා ගැනීම සම්බන්ධයෙන් මෙම විධානය බල නොපැවත්වේ.

මෙම විධානය වර්ෂ 2021 ජුනි මස 11 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

මේජර් ජෙනරාල් **ශාන්ත දිසානායක** (විශ්‍රාමික),
සභාපති.

2021 ජුනි මස 11 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.